# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,257 - 2021 දෙසැම්බර් මස 03 වැනි සිකුරාදා - 2021.12.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම ... ... ... | 604 |
| බුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2021 දෙසැම්බර් මස 24 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 දෙසැම්බර් මස 10 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


603- B 082293 — 353 (2021/12)
D 1 -

# පිස්කල් විකිණීම්

## පිස්කල් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

පොළොන්නරුව දිසා අධිකරණයේ දී ය

පොළොන්නරුව ශාඛා කාර්යාලයක් පවත්වාගෙන යනු ලබන දූනට කැලණිය, වෙදමුල්ල, නුවර පාර, අංක 933 දරන ස්ථානයේ ප්‍රධාන කාර්යාලය පිහිටා ඇති ප්‍රාදේශීය සංවර්ධන බැංකුව.

නඩු අංක : 17737/MB/18
නඩුවේ වටිනාකම : රු. 2,807,988.07

*....................පෙත්සම්කරු.*

*එදිරිව*

වික්‍රම හේරත් මුදියන්සේලාගේ සුධර්මා මල්කාන්ති,
අංක 117/1,
ගඟතැන්න, අඟුණාවල,
පේරාදෙණිය.

*........................වගඋත්තරකරු.*

පොළොන්නරුව දිසා අධිකරණයේ පැවති ඉහත අංක දරන නඩුව සඳහා වර්ෂ 2019ක් වූ ජූලි මස 26 වැනි දිනැති තීන්දුව අනුව පොළොන්නරුව දිසා අධිකරණය මඟින් තහනමට ගෙන ඇති විකිණීමේ ඇස්කීසියේ බලය මත රුපියල් විසිඑක් ලක්ෂ විසිඑක් දහස් නවසිය අසූවයි ශත තිස් දෙකක (රු. 2,121,980.32) මුදල ගෙවීම පැහැර හැර ඇති අතර, ඒ අනුව එකී ණය මුදලේ ශේෂය මත වර්ෂ 2013.12.17 දින සිට සම්පූර්ණ මුදල ගෙවා අවසන් කරන තෙක් වර්ෂයකට 8%ක පොලී මුදලක් ද ඉන් අනතුරුව තීන්දු ප්‍රකාශයේ සඳහන් සමස්ත මුදල මත එකී මුදල පැමිණිලිකාර ආයතනයට සම්පූර්ණයෙන් ගෙවා නිමකරන තුරු නෛතික පොලිය සහ නඩු ගාස්තු අය කරවා ගැනීම සඳහා පෙත්සම්කාර ආයතනයට වගඋත්තරකරුවන් විසින් ගෙවීමට අපොහොසත්ව ඇති බැවින් එකී වගඋත්තරකරුවන්ට හිමි මෙහි පහත උපලේඛනයේ දක්වෙන දේපල වර්ෂ **2021ක් වූ දෙසැම්බර් මස 29 වැනි දින පෙ. ව. 11.00ට** පහත උපලේඛනයෙහි සඳහන් දේපල පිහිටා ඇති ස්ථානයේ දී විකුණනු ලබන බවට මෙයින් දැනුම් දෙනු ලැබේ.

***පිස්කල් තැන විසින් තහනමට ගත් දේපළහි උපලේඛනය***

උතුරු මැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මැද පත්තුවේ අංක 198 ලක්ෂ උයන ග්‍රාම සේවා නිළධාරි කොට්ඨාසයේ ලක්ෂ උයන නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, සර්වේ ජනරාල් භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක අ.ජ.පි.පො. 32 දරන කට්ටි කැබීමේ පිඹුරේ/ලොට් 55 ජනපද නිලධාරි විසින් සම්පාදිත රේඛා සටහනේ අංක 58-11 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් රූඩ් එකයි, පර්චස් තිස් අටක් (රූඩ්. 01, පර්. 38) හෙක්ටයාර් බින්දුවයි දශම එකයි නවයයි හතයි තුනක් (හෙක්. 0.1973)ක් විශාලත්වය ඇත්තා වූ ද පහත දක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩමකට මායිම්,

| | | |
|---|---|---|
| උතුරට | : | කැබලි අංක 54 ද, |
| නැගෙනහිරට | : | කැබලි අංක 55-12 ද, |
| දකුණට | : | කැබලි අංක 55-14 ද |
| බටහිරට | : | කැබලි අංක 55-10 ද |

යන මෙකී මායිම් තුළ පිහිටි ඉඩම සහ එහි තුළ වූ සියලු දෙයත් වේ.

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල් තැන,
දිසා අධිකරණය - පොළොන්නරුව.

12-130

## පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

කොළඹ දී පැවැත්වෙන සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන බස්නාහිර පළාතේ පළාත්බද මහාධිකරණයේ දී ය

ඩීඑෆ්සීසී බැංකුව පීඑල්සී,
අංක 73/5, ගාලු පාර, කොළඹ 03.

නඩු අංක : CHC/97/2013/MR ....................*පැමිණිලිකරු.*

*එදිරිව*

1. ඩයිනග්‍රෝ (ප්‍රයිවෙට්) ලිමිටඩ්,
අංක 549 බී, ඉසුරු උයන, ඩී. පී. විජේසිංහ මාවතට ඔබ්බෙන්,
තලංගම දකුණ, බත්තරමුල්ල.

2. ටර්බයින් වෙන්ටිලේෂන් සිස්ටම්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්,
අංක 59 බී, ඉසුරු උයන, ඩී. පී. විජේසිංහ මාවතට ඔබ්බෙන්,
තලංගම දකුණ, බත්තරමුල්ල.

.......................*විත්තිකරුවන්.*

ඉහත සඳහන් 1 වැනි සහ 2 වැනි විත්තිකරුවන් වෙතය.

මෙම නඩුවේ 2018ක් වූ මැයි මස 16 වන දින ඇතුලත් කර ඇති සමථ තීන්දු ප්‍රකාශය ප්‍රකාරව පැමිණිල්ලේ ආයාචනයේ අයැද ඇති පරිදි මෙම නඩුවේ විත්තිකරුවන්ට විරුද්ධව,

**1 වැනි නඩු නිමිත්ත වශයෙන්**

එකී ශ්‍රී ලංකා රුපියල් 4,037,265/43 ක මුදලක් ද, මුල් මුදල වශයෙන් රුපියල් 3,000,000/- ක මුදල සම්පූර්ණයෙන් ගෙවා බේරුම් කරන තෙක් එම මුල් මුදල මත 2012 මාර්තු මස 01 වැනි දින සිට වාර්ෂිකව 29%ක අනුපාතය මත පොලිය ද,

**2 වැනි නඩු නිමිත්ත වශයෙන්**

එකී ශ්‍රී ලංකා රුපියල් 4,037,265/43 ක මුදලක් ද, මුල් මුදල වශයෙන් රුපියල් 3,000,000/- ක මුදල සම්පූර්ණයෙන් ගෙවා බේරුම් කරන තෙක් එම මුල් මුදල මත 2012 මාර්තු මස 01 වැනි දින සිට වාර්ෂිකව 29%ක අනුපාතය මත පොලිය ද,

**3 වැනි නඩු නිමිත්ත වශයෙන්**

එකී ශ්‍රී ලංකා රුපියල් 3,312,686/15 ක මුදලක් ද, මුල් මුදල වශයෙන් රුපියල් 2,449,639.44/- ක මුදල සම්පූර්ණයෙන් ගෙවා බේරුම් කරන තෙක් එම මුල් මුදල මත 2012 මාර්තු මස 01 වැනි දින සිට වාර්ෂිකව 29%ක අනුපාතය මත පොලිය ද,

**4 වැනි නඩු නිමිත්ත වශයෙන්**

එකී ශ්‍රී ලංකා රුපියල් 4,037,265/43 ක මුදලක් ද, මුල් මුදල වශයෙන් රුපියල් 3,000,000/- ක මුදල සම්පූර්ණයෙන් ගෙවා බේරුම් කරන තෙක් එම මුල් මුදල මත 2012 මාර්තු මස 01 වැනි දින සිට වාර්ෂිකව 29%ක අනුපාතය මත පොලිය ද,

**5 වැනි නඩු නිමිත්ත වශයෙන්**

එකී ශ්‍රී ලංකා රුපියල් 4,037,265/43 ක මුදලක් ද, මුල් මුදල වශයෙන් රුපියල් 3,000,000/- ක මුදල සම්පූර්ණයෙන් ගෙවා බේරුම් කරන තෙක් එම මුල් මුදල මත 2012 මාර්තු මස 01 වැනි දින සිට වාර්ෂිකව 29%ක අනුපාතය මත පොලිය ද,

ඇතුළත්ව අයකර ගැනීමට විත්තිකරුවන්ට එරෙහිව නඩු තීන්දුවක් සහ තීන්දු ප්‍රකාශයක් ඇතුළත් කර ඇති හෙයින් ද, එලෙස තීන්දු කරන ලද තීන්දුව අනුව විත්තිකරුවන් විසින් ගෙවීම් පැහැර හැර ඇති බැවින් එකී මුදල් අයකර දීම සඳහා කොළඹ වාණිජ මහාධිකරණයේ ඉහත අංක දරන නඩුවෙන් මා වෙත නිකුත් කර ඇති විකිණීමේ ආඥාව ප්‍රකාරව මෙහි පහත උපලේඛනයේ මැනවින්

විස්තර කර ඇති ඉඩම හා ඒ මත පිහිටි ගොඩනැගිලි ගහකොළ ආදී සියලු දේ **2021ක් වූ දෙසැම්බර් මස 29 වැනි දින ප. ව. 1.00ට** එම දේපල පිහිටා ඇති බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරලේ, පල්ලේ පත්තුවේ කඩුවෙල ප්‍රාදේශීය සභාවේ බත්තරමුල්ල - තලංගම ඒකකයේ සීමාව ඇතුළත වරිපනම් අංක 549/බී (ඉසුරු උයන) එකී දේපල පිහිටා ඇති ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් ප්‍රසිද්ධ කොට ප්‍රකාශ කරනු ලැබේ.

වෙන්දේසියේ දී ඉහළම ලංසු තබන්නා ගැණුම්කරු වන අතර, වෙන්දේසිය අවසන්වූ වහාම ගැණුම්කරු විසින්,

1. මුළු ගැණුම් මිලෙන් 25%ක මුදලක් ද,
2. තක්සේරු ගාස්තුව වන 0.5%ක් ද,
3. වෙන්දේසිය *ගැසට්* කිරීමේ ගාස්තු,
4. පුවත්පත් දැන්වීම් සඳහා දරන ලද වියදම් ද,
5. අනෙකුත් ප්‍රචාරක කටයුතු සඳහා වියදම් ද
6. පළාත් පාලන ආයතන වෙත ගෙවිය යුතු 01%ක ගාස්තුව ද,
7. රජයේ පවුන්ඩේජ් ගාස්තු ද,

විකිණීම අවසන් වූ වහාම ගැණුම්කරු විසින් මුදලින් මා වෙත (වෙන්දේසිකරු) ගෙවිය යුතුය. චෙක්පත් භාරගනු නොලැබේ. ගැණුම් මිලෙන් ඉතිරි මුදල වන 75%ක මුදල දින 30ක් ඇතුළත කොළඹ වාණිජ මහාධිකරණයේ ඉහත අංක දරන නඩුවට තැන්පත් කළ යුතුය.

## උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරලේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභාවේ, බත්තරමුල්ල - තලංගම ඒකකයේ සීමාව ඇතුළත තලංගම දකුණ පිහිටි මිල්ලගහවත්තඹිවිට හෝ අලුබෝගහලන්ද යනුවෙන් හඳුන්වනු ලබන වරිපනම් අංක 549/බී (ඉසුරු උයන) දරන (බලයලත් මිනින්දෝරු සහ තලමිතිකරු වී. ඒ. එල්. සේනාරත්න විසින් සාදන ලද වර්ෂ 1967ක් වූ අගෝස්තු මස 20 වැනි දිනැති අංක 3625 දරන නැවත බෙදා වෙන් කිරීමක් වන පිඹුරේ ලොට් 13) බලයලත් මිනින්දෝරු සහ තලමිතිකරු අයි. ඒ. සී. සේනාරත්න විසින් සාදන ලද වර්ෂ 1989 ක් වූ ජනවාරි මස 20 වැනි දිනැති අංක 3440 දරන පිඹුරේ ලොට් 1 වශයෙන් සලකුණු කර නිරූපිත බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් උතුරට : බලයලත් මිනින්දෝරු එම්. බී. ද සිල්වා විසින් සාදන ලද වර්ෂ 1918ක් වූ පෙබරවාරි මස 11 වැනි දිනැති අංක 232 දරන පිඹුරේ ලෝට් සී කැබැල්ල ද, නැගෙනහිරට : ඉසුරු උයන වරිපනම් අංක 253/36 දරන පරිශ්‍රය ද, දකුණට : ඉසුරු උයන සහ බස්නාහිරට එකී අංක 3625 දරන පිඹුරේ ලොට් 14 දරණ කැබැල්ල ද වන ඉහත සඳහන් අංක 3440 දරන පිඹුර ප්‍රකාරව එහි පිහිටි ගොඩනැගිලි ගහකොළ පළතුරු, පස සහ සියලු දේ සමඟ ප්‍රමාණයෙන් පර්චස් දහ නවයකුත් දශම අටයි හතක් (අ. 0, රූ. 0, පර්. 19.87) වන හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පී. 1171/244 හි ලියාපදිංචි කර ඇති ඉඩම.

අශ්වයන්, හරකුන් හෝ වෙනත් සතුන් ඇතිව හෝ නැතිව, මෝටර් කාර්, මෝටර් ලොරි, බර පැටවූ හෝ නොපැටවූ වෙනත් සෑම වර්ගයකම වාහන ඇතිව හෝ නැතිව මෙහි විශේෂයෙන්ම විස්තර කරන ලද මාර්ගය තුළ හෝ ඔස්සේ හෝ ඒ මත්තෙන් මින්පසු සදාකල්හිම කවර ස්වභාවයක වුව සියලුම කාරණාවන් සඳහා තමන්ගේ කැමැත්ත සහ අභිලාෂය පරිදි දිවා කාලයෙහි දී හෝ රාත්‍රී කාලයේ දී පයින් හෝ වෙනත් ලෙසකින් යාමට ඒමට පසු කිරීමට, නැවත පසු කිරීමට උකස් දීමනාකරුට, ඔහුගේ ආගන්තුකයන්ට, ඉංජිනේරුවන්ට, වාස්තු විද්‍යාඥයන්ට, ශ්‍රමිකයන්ට, සේවකයන්ට, කුලී නිවැසියන්ට, බලපත්‍රලාභීන්ට සහ ආරාධිතයන්ට, ආයතනයේ නිර්යාතයේ ප්‍රතික්‍රමණයේ පූර්ණ සහ නිදහස් අයිතිය ස්වාධීනතාව සහ අවසරය ද ඒ සමඟ දරන පාවිච්චි කරනු ලබන භුක්ති විඳින සියලු සහ ඒ ඒ අයිතීන් මං, වාසි සහ අනුබද්ධයන් ද ඒ මත හෝ උඩින් විදුලි කේබල් සහ උඩින් කම්බි සහ ජලාපවහන, ගෑස් සහ ජලනල සහ කවර ස්වභාවයක වුව ගෘහෝපකරණ හෝ වෙනත් උපක්‍රම ද යෙදීමේ පූර්ණ සහ නිදහසේ සදාකාලීන අයිතිය සහ ස්වාධීනතාව.

ඉහත කී තලංගම පිහිටි මිල්ලගහවත්තඹිවිට *නොහොත්* අලුබෝගහලන්ද නමැති එකී ඉඩමට අදාලව බලපත්‍රලත් මිනින්දෝරු සහ තලමිතිකරු වී. ඒ. එල්. සේනාරත්න විසින් පිළියෙල කරන ලද වර්ෂ 1967ක් වූ අගෝස්තු මස 20 වැනි දිනැති සහ අංක 3625 දරන එකී පිඹුරේ අඩි විස්සක පළල මාර්ග රක්ෂිතය වූ ද එකී පිඹුරේ ආර් 1 වශයෙන් නිරූපිත ඉඩම් කොටස වූ ද, අඩි 20ක් පළල ඉසුරු උයන නැමැති මුලු මාර්ගයට මායිම් උතුරට : 1, 6 ආර් 2, 7, 8, 11 ආර් 4, 12-17 දරන ඉඩම් කොටස්ද ; නැගෙනහිරට : මාර්ගය, දකුණට : 18 සිට 23 දක්වා ද, 24 ආර් 3, 27, 28, 30 දරන ඉඩම් කොටස් ද, බස්නාහිරට : බී දරන ඉඩම් කොටස සහ ප්‍රමාණයෙන් අංක 3625 දරන එකී පිඹුර ප්‍රකාරව රූඩ් එකයි පර්චස් විස්සක් (රූ. 01, පර්. 20) ද, හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 1178/191 හි ලියාපදිංචි වූ ද එකී මාර්ගය.

ආර්. කේ. ගාමිණී වීරසිරි,
අධිකරණ රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්.

2021ක් වූ නොවැම්බර් මස 16 වැනි දින,
කොළඹ 12,
වාණිජ මහා අධිකරණයේ දී ය.

12-09

**ප්‍රසිද්ධ ඉඩම් වෙන්දේසියයි**

**කොළඹ වාණිජ මහාධිකරණයේ දී ය**

නඩු අංකය : CHC 0044/2012/MR.

කොළඹ 10, ටී. බී. ජායා මාවතේ, අංක 479 (කලින් අංක 48) දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය, සහ හොරණ ශාඛා කාර්යාලයක් පවත්වාගෙන යන හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී (කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හැඳුන්වනු ලැබූ)

................................*පැමිණිලිකරු.*

එදිරිව

1. මහ අම්බලන්ගොඩ පතියන්දූවගේ සුනිල්
2. පෝදාගොඩගේ දෝන ශ්‍රියානි
   අංක 49/ඞී, පිටවිල පාර, සව්සිරි උයන, කුඹුර, ගෝනපල.

..............................*විත්තිකරුවන්.*

*නව ලිපිනය :*

අංක 34, සුදේරිස් සිල්වා මාවත, හොරණ සහ
අංක 34/ඒ, සුදේරිස් සිල්වා මාවත, හොරණ.

වර්ෂ 2014 ක් වූ පෙබරවාරි මස 26 වැනි දින ඉහත අංක දරන නඩුවේ ඇතුලත් කරන ලද තීන්දු ප්‍රකාශය අනුව ඉහත නම් කර ඇති විත්තිකරුවන් විසින් පැමිණිලිකරුට මෙහි පහත පළවන උපලේඛනයෙහි සවිස්තරව විස්තර කර තිබෙන ඉඩම් සහ ගොඩනැගිලිද ඒවාට අයත් සියලු අයිතිවාසිකම් වරප්‍රසාද, පරවශතා සහ අනුබන්ධනද ඒ දේපලවලට හෝ ඒවායින් ඒවා කෙරෙන් හෝ ඒවායේ සෑම කොටසකටම විත්තිකරුවන් සතු සියලු මුදල්, හිමිකම්, අයිතිවාසිකම්, ස්වාර්ථ සම්බන්ධතා හිමිකාරත්ව සහ ඉල්ලුම් යනාදිය ඉහත සඳහන් රු. 4,561,041.93 ක් වූ මුදල සහ ඒ සඳහා 2011 සැප්තැම්බර් මස 23 වැනි දින සිට සම්පූර්ණයෙන් ගෙවා නිම කරන තෙක් වර්ෂයකට 24% බැගින් පොළියද, ඉහත කී සී. සී. 1 සහ සී 2 යනුවෙන් ලකුණු කළ උකස් බැඳුම්කරයන් පදනම් කරගෙන එකතු කල අය මත බදු (වැට් බදු), ද සමග ගෙවීමට බැඳි යටත්ව පවතින බවට ආඥාවක් හා තීන්දු ප්‍රකාශ කරන ලදී. තීන්දු ප්‍රකාශයේ දින සිට මාස දෙකක් ඇතුළත රු. 4,561,041.93 යන මුදල් ප්‍රමාණය සහ ඒ සඳහා 2011 සැප්තැම්බර් මස 23 දින සිට වර්ෂයකට 24% බැගින් පොළිය හා ගාස්තු පැමිණිලිකරුට ගෙවන මෙන් විත්තිකරුවන්ට ගරු අධිකරණය විසින් ආඥා කරන ලෙස හා එසේ ගෙවීම් පැහැර හරිනු ලැබුවහොත් පළවන උපලේඛනයේ විස්තර කර තිබෙන ඉඩම් හා ගොඩනැගිලි දෙවන උපලේඛනයේ විස්තර කර ඇති මාර්ග අයිතියට යටත්ව පිස්කල්වරයා ලවා ගරු අධිකරණය නියම කර පත්කරනු ලබන බලයලත් වෙන්දේසිකරුවකු ලවා එසේ නියම කරන විකුණුම් කොන්දේසි මත විකිණීමට ආඥා කොට තීන්දු ප්‍රකාශ කරන ලදී. එම පිස්කල්වරයාට/වෙන්දේසිකරුට පහත දැක්වෙන විධාන කර බලය දෙන ලෙසට එනම්,

එම ඉඩම් හා පරිශ්‍රය තක්සේරු වටිනාකමට විකිණීම සඳහා ප්‍රථමයෙන් ඉදිරිපත් කිරීමටත්, එම තක්සේරු වටිනාකමට මිලදී ගැනීම සඳහා ලංසු තබන්නන් නොමැති වුවහොත් කොමිසම නිකුත් කරන අවස්ථාවේදී තීන්දු ප්‍රකාශය යටතේ අයවිය යුතු මුදලට විකිණීම සඳහා ඉදිරිපත් කරන ලෙසත්, එම විකිණීමේදී ද ලංසුකරුවන් නොමැති වුවහොත් ඉන් අනතුරුව ඉහලම ලංසුකරුට හෝ ලංසුකරුවන්ට විකිණීම සඳහාත් බලය දෙන ලෙස ආඥා කොට ප්‍රකාශ කරන ලදී. එම ඉඩම් පරිශ්‍රය තක්සේරු වටිනාකමට විකිණීම සඳහා ප්‍රථමයෙන් ඉදිරිපත් කිරීමට උකස් පනතේ 52(1) වගන්තිය යටතේ නියමයක් කර තිබෙන අවස්ථාවක එම පළමු විකිණීමේදී ඉදිරිපත් වූ ඉහලම ලංසුව උකස් පනතේ 51(3) වගන්තිය යටතේ නියම කරනු ලැබූ තක්සේරු වටිනාකමට වඩා අඩු වුවහොත් එම ඉඩම ප්‍රථම විකිණීමේ දී නොවිකිණිය යුතු බවට සහ එවැනි අවස්ථාවක එම ඉඩම දෙවන වරක ද විකිණීමක් කළ යුතු බවට සහ එම දෙවන විකිණීමේදී ද එම තක්සේරු වටිනාකමට මිලදී ගැනීම සඳහා ගැනුම්කරුවන් නොමැති වුවහොත් කොමිසම නිකුත් කළ අවස්ථාවේ අයවිය යුතුව තිබුණු මුදලට විකිණීම සඳහා ඉදිරිපත් කරන ලෙසත්, එම විකිණීමේදී ද ලංසුකරුවන් නොමැති වුවහොත් කොමිසම නිකුත් කළ අවස්ථාවේ අයවිය යුතුව තිබුණු මුදලට විකිණීම සඳහා ඉදිරිපත් කරන ලෙසත්, එම විකිණීමේදී ද ලංසුකරුවන් නොමැති වුවහොත් ඉන් අනතුරුව උකස් පනතේ 50(4) වගන්තියට අනුකූලව ඊලඟ ඉහලම ලංසුකරුට හෝ ලංසුකරුවන්ට විකිණීම සඳහා ඉදිරිපත් කිරීමටත් ආඥා කොට තීන්දු ප්‍රකාශ කරන ලදී. එකී ඉඩම් සහ ගොඩනැගිලි මිලදී ගැනීම සඳහා ලංසු තැබීමට පැමිණිලිකරුට හෝ පැමිණිලිකරු වෙනුවෙන් වෙනත් තැනැත්තෙකුට ඉඩ දීමට හා පැමිණිලිකරු ගැනුම්කරු බවට පත්වුවහොත්

පැමිණිලිකරුගේ හිමිකම් පෑමේ හා ගාස්තුවල ප්‍රමාණය දක්වා පැමිණිලිකරුට බැරවාසි දීමටත් ආඥාකොට තීන්දු ප්‍රකාශ කරන ලදී. එම විකිණීමේ ගැණුම්කරු හෝ ගැණුම්කරුවන් විකුණුම් කොන්දේසි අනුව ක්‍රියාකල පසුව ගැණුම්කරු පැමිණිලිකරු නම් පැමිණිලිකරුට ඉඩහරිනලද බැර වාසිය අනුමත කරන අධිකරණ ආඥාවක් ඉදිරිපත් කළ පසුව හා ගැණුම්කරු හෝ ගැණුම්කරුවන් තුන්වන පාර්ශවයන් හෝ පාර්ශවකරුවන් වේ නම් ඔවුන් විසින් ගැනුම් මිල නිසි පරිදි අධිකරණයේ තැන්පත් කර තිබෙන බවට අධිකරණ ආඥාවක් හෝ අධිකරණ ආඥා ඉදිරිපත් කල පසුව ගැණුම්කරු හෝ ගැණුම්කරුවන් නමට නීතිය අනුව නිසි ආකෘතියෙහි වූ පැවරුම්කරයන් හෝ පැවරුම්කර ලියා අත්සන් කරදීමටත් පිස්කල්වරයාට/වෙන්දේසිකරුට නියම කර බලය දෙන ලෙස ආඥා කොට තීන්දු ප්‍රකාශ කරන ලදී. ඉහත කී පරිදි විකුණන ලද උකස් දේපලෙහි නිරවුල් හා හිස් සන්තකය එය මිලදී ගත් ගැණුම්කරුට හෝ ගැණුම්කරුවන්ට භාර දෙන මෙන් පිස්කල්වරයාට විධාන කරන ලෙස ආඥා කොට තීන්දු ප්‍රකාශ කරන ලදී. විකිණීමෙන් ලැබෙන මුදල් පැමිණිලිකරුගේ හිමිකම්පෑම පොළිය සහ ගාස්තු ගෙවීම සඳහා යොදන ලෙස ආඥා කොට තීන්දු ප්‍රකාශ කරන ලදී.

අධිකරණය විසින් නම් කරනු ලැබූ ආඥාවකදී හැර මේ අධිකාරය ක්‍රියාවේ යෙදවීම නොනවත්වන ලෙස මෙයින් වැඩිදුරටත් විධානය කරනු ලැබූ හෙයින් එකී අධිකරණයෙන් මා වෙත ලැබී ඇති විකිණීම සඳහා වූ අධිකාරී පත්‍රයේ බලය පිට මා විසින් පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති නිශ්චල දේපල වූ, පර්චස් 13.93 ක් වූ ''කහටගහවත්ත හෙවත් කහටගහකනත්ත'' යනුවෙන් හඳුන්වන ඉඩම් කැබැල්ල සහ ඒමත පිහිටි ගොඩනැගිලි හා වෙනත් සියලු දේ

**වර්ෂ 2021 ක් වූ දෙසැම්බර් මස 23 වැනි දින ප.ව. 2.00 ට** ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

*පිවිසීම.*- මේ සඳහා ප්‍රවේශය හොරණ පොකුණුවිට සිට කොළඹ මාර්ගයේ කුඹුක හංන්දියට පැමිණ වමට ඇති ගැලනිගම මාර්ගයේ මීටර් 300 ක් පමණ ගියවිට දකුණට ඇති පිටිවල පාරේ මීටර් 200 ක් පමණ ගිය පසු පාරෙන් දකුණු අත පැත්තේ මෙම දේපල හමුවෙනු ඇත.

*ගෙවීමේ ක්‍රමය.*-

වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය. (චෙක්පත් භාරගනු නොලැබේ.)

1. විකුණුම් මිලෙන් 25% (සියයට විසිපහක්),
2. වෙන්දේසිකරුගේ වෘත්තිය ගාස්තු (ගැනුම් මිලෙන්) 2.5% (සියයට දෙකයි දශම පහයි),
3. සියළුම ප්‍රචාරක ගාස්තු,
4. මුද්දර ගාස්තු,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු,
6. ප්‍රාදේශීය සභා ගාස්තු 1% (සියයට එකක්),
7. නොතාරිස් ගාස්තු,
8. පළාත් පාලන ආයතනයන් විසින් පනවනු ලැබූ වෙනත් බදු ද ආදිය,
9. ගැනුම් මිලෙන් පළමුවන රු. 7,500 ට රු. 150 ක්ද ඊට අමතරව ලැබෙන සෑම රු. 1,000 ටම රු. 5 බැගින් වූ අධිකරණයට ගෙවිය යුතු ගාස්තු ද, ඉතිරි 75%ක (සියයට හැත්තෑපහක්) මුදල දින 30 ක් ඇතුලත කොළඹ වානිජ මහාධිකරණයේ නඩු අංක CHC 0044/2012/MR දරන නඩුවේ බැරට තැන්පත් කළ යුතු අතර එසේ ක්‍රියා කිරීමට අපොහොසත් වුවහොත් මුලින් තැන්පත් කරන ලද මුදල් ආපසු නොගෙවන අතර එකී දේපල නැවත වෙන්දේසියේ තැබීමට ක්‍රියා කරනු ඇත.

අජිත් දසනායක,
උසාවි කොමසාරිස්/සාමවිනිසුරු (මුළු දිවයිනටම)/බලයලත්
වෙන්දේසිකරු සහ තක්සේරුකරු.

11-262

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | *රු.* | *ශ.* |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 | 0 |
| තනි තීරුවකට හෝ *ගැසට්* පිටුවකින් අඩකට ... ... ... | 1,300 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ *ගැසට්* පිටුවකට ... ... ... | 2,600 | 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා ජේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... ...... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

## * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල | තැපැල් ගාස්තුව |
|---|---|---|
| I වැනි කොටස : | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 0 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 0 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

### 2021 වර්ෂය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| **දෙසැම්බර්** | 2021.12.03 | සිකුරාදා | 2021.11.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.12.10 | සිකුරාදා | 2021.11.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.12.17 | සිකුරාදා | 2021.12.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.12.24 | සිකුරාදා | 2021.12.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.12.31 | සිකුරාදා | 2021.12.17 | සිකුරාදා | දහවල් | 12.00 |

### 2022 වර්ෂය

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **ජනවාරි** | 2022.01.07 | සිකුරාදා | 2021.12.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.01.13 | බ්‍රහස්පතින්දා | 2021.12.31 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.01.21 | සිකුරාදා | 2022.01.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.01.28 | සිකුරාදා | 2022.01.13 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| **පෙබරවාරි** | 2022.02.03 | බ්‍රහස්පතින්දා | 2022.01.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.02.11 | සිකුරාදා | 2022.01.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.02.18 | සිකුරාදා | 2022.02.03 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2022.02.25 | සිකුරාදා | 2022.02.11 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.